# ගැමි ආර්ථිකයට නව උදවක්!

**දැනට යෝජිතව ඇති කෘෂිකාර්මික ගම්මාන බිහිවීම, ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත් ඔවුන්ගේ වගා කටයුතු වානිජ මට්ටමකට ගෙන ඒමටත් පොළඹවන සුළුය. මේවා තුළින්, කෘෂි නිෂ්පාදන උසස් මට්ටමකට ගෙන ඒමට සහ ඒවායේ තත්වය වැඩි දියුණු කිරීමටද — නොයෙකුත් ආර්ථික උත්තෝලන අවස්ථා-වලදී සාමූහික ක්‍රියාකාරිත්වයෙන් අඩු නැතිව පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම මගින් වෙළඳපොල සහ නිෂ්පාදකයා අතර මනා සම්බන්ධයක් ගොඩ නැංවීමටද හැකිවනු ඇත.**

කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් සියයට හැත්තෑපහක් පමණවූ, බහුතරයක් ශ්‍රී ලංකාවේ ජනගහනය තුළ ව්‍යාප්තව සිටී. මෙම බහුතරය කාර්යක්ෂමව උපයෝගීකර ගනිමින්, වර්තමාන රජය කෘෂිකර්මාන්තයේ නව නැම්මක් තුළින් ගැමි ගොවියාගේ මෙන්ම මුළු රටේම ආර්ථික ව්‍යුහය නැවත සකසා ඉහළ මට්ටමකට ගෙන ඒමට ප්‍රබල මෙහෙවරක යෙදී සිටී.

වර්ෂ 1948 දී අප නිදහස ලබාගත් දින පටන්ම කෘෂිකර්මාන්තය සහ ඒ තුළ උද්ගතව ඇති ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා නිරන්තර උත්සාහයක යෙදින. විදේශ ආධිපත්‍ය විසින් අප රට වෙත පටවන ලද වතු ආර්ථිකය හේතුවෙන් බිඳ වැටුනු සම්ප්‍රදායිකවූ ගොවිතැන් රටාව නැවත නගා සිටුවා ආර්ථික දේහය සුවපත් කිරීමට වරින්වර පත්වූ රජයයන් නොයෙක් ක්‍රම සැළසුම් දියත් කළත්, දනුත් අද වන විටත් අප රටේ සහල් ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා විදෙස් වෙළඳ පොලවල පිහිට පැතීමට සිදුව තිබේ.

මේ හැරුණු විට, කෘෂි කර්මාන්තයේ නොදියුණු-පහත් මට්ටම වලට හේතුවූ වෙනත් කරුණු අතර නිෂ්පාදනවල මිල තත්වය, ශ්‍රම ඵලදායකත්වය අඩුවීම-දියුණු තාක්ෂණ ක්‍රමවල හිඟකම ආයෝජනය වන ප්‍රාග් ධනයට ලැබෙන ප්‍රතිලාභ ඉතා සුළුවීම ආදී කරුණුද හේතු සාධක විය. එමෙන්ම ග්‍රාමීය ජනතාව රැකියා, වැඩි වැටුප් හා ශිල්පීය දැනුම පතා නගරවලට සංක්‍රමණය වීමත්, ජනගහන වර්ධන වේගය වැඩිවීමටත්, වගාකළ හැකි ඉඩම් ප්‍රමාණය සීමාවීමද කෘෂිකර්මයේ වර්ධනයට සහ නිෂ්පාද-නයට අහිතකර ලෙස බලපාන ලදී. ඒ කෙසේ වුවද තවමත් මෙරට ආර්ථික දේහයේ විශාල බලපෑමක් කිරීමට කෘෂිකර්මාන්තයට හැකිවී ඇත.

මෙතෙක් පැවති සෑම රජයක්ම කෘෂිකර්මාන්තයේ නවෝදයක් උදාකිරීමේ පරමාර්ථයෙන් විශේෂ යෝජනා සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කළත් ඒවායින් සිදුවූ ප්‍රයෝජන ඉතා අල්ප වූයේ ඇයිද යන්න නැවත විමසුමකට භාජනය කළ යුතුව ඇත. මනා කළමණාකාරීත්වයක් යටතේ ප්‍රායෝගික වූ ඉඩම් හා වාරිමාර්ග ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ මෙහෙය වූයේ නම් සමහරවිට අද පවතින සමාජ අර්බුද මෙතරම් බරපතල නොවනු ඇත.

ගොවිපල් යාන්ත්‍රික උපදේශක

**එම්. එම්. පාලිත මහින්ද මුණසිංහ**

දැන් යෝජිතව ඇති කෘෂිකාර්මික ගම්මාන බිහිවීම, ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමටත් ඔවුන්ගේ වගා කටයුතු වානිජ මට්ටමකට ගෙන ඒමටත් පොළඹවන සුළුය. මෙම ගම්මාන තුළින්, කෘෂි නිෂ්පාදන උසස් මට්ටමකට ගෙන ඒමට සහ ඒවායේ තත්වය වැඩි දියුණු කිරීමටද - නොයෙකුත් ආර්ථික උත්තෝලන අවස්ථාවලදී සාමූහික ක්‍රියාකාරිත්වයෙන් අඩු නැතිව පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම මගින් වෙළඳපොල සහ නිෂ්පාදකයා අතර මනා සම්බන්ධයක් ගොඩ නැංවීමටද හැකිවනු ඇත.

ඒ ඒ පළාත්වලට ගැලපෙන ආර්ථිකව වැදගත් වන බෝග කිපයක් තෝරා මෙම ගම්මාන වල ව්‍යාප්ත කළ හැක. ඒ සඳහා විශ්ලේෂණයන් සැලකිය යුතු වන්නේ පවතින දේශගුණික රටාව සහ පාංශු ව්‍යුහය සම්බන්ධව මනා හැදෑරීමක් කිරීමයි. මෙම උපරිම සළඳ ගම්මාන සමග ඒ ඒ පළාත්වල ඇති රාජ්‍ය කෘෂි ආයතනයන් සම්බන්ධීකරණය කළ හැක. එම රාජ්‍ය ආයතනවල කටයුතු නැවත ප්‍රතිසංස්කරණය කොට මනා කලමනාකාරිත්වයක් යටතේ දක්ෂ නිලධාරීන් ලවා අධීක්ෂණය කරවීම සහ මෙහෙයවීම කළ යුතුය. එබඳු ආයතන ආශ්‍රයෙන් අදල පළාතේ කෘෂි සහ පශු සම්පත් වැඩි දියුණු කළ හැක. එමෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොලට උසස් තත්වයේ කෘෂි නිෂ්පාදන හඳුන්වාදීමට මෙම ගොවිපල් උපයෝගී කරගත හැක.

මෙම ක්‍රමය තුළින් ග්‍රාමීය ගොවි ජනතාවගේ මුළු ජීවන ක්‍රමයම සාකල්‍යයෙන්ම වෙනස්කොට කෘෂිකර්මාන්තයේ සැබෑ විප්ලවයක්-සැබෑ වෙනසක්-මෙමගින් සිදුවනු ඇත. ගෙවතු වගාව වැනි කටයුත්තක් හුදෙක් "ස්වකීය පරිභෝජනය සඳහා පමණක්" යන පටු දෘෂ්ටිමය පුද්ගලවාදී ආකල්පයකි. ඉන් මිදීගෙන, සාමූහිකත්වය තුළින් මහා පරිමාණ වගාවක් ආරම්භ කිරීමේදී ප්‍රාදේශීය වශයෙන් කෘෂි නිෂ්පාදනය ඉහළ යයි. ජනතාවගේ ප්‍රාථමික ආහාර අවශ්‍යතා සපුරාගත හැක. දේශීය කෘෂි ආර්ථිකය ශක්තිමත් වීමෙන් ගොවීන්ගේ වත්කම් ඉහළ යයි. මුළු මහත් කෘෂි රටාවෙම වර්ධනය සහතික වෙයි.

වී වගාව-අතිරේක බෝග-එළවළු-ධාන්‍ය ආදී සෑම කෘෂි නිෂ්පාදනයකම සැපයුම වැඩි කිරීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සහ තාක්ෂණය යොදා ගත යුතුය. ඒ ඒ පළාත්වලට අනුරූපිත තත්ත්වයන් පිළිබඳ ගැඹුරින් විමසා, මුළු මහත් ගොවි ජනතාවම නියෝජනය වන පරිද්දෙන් මෙම සමීක්ෂණ කළ යුතුව ඇත.

අවධිමත් ලෙස වැයවන ග්‍රාමීය ගොවි ක්‍රමය' තුළින් සංවිධිත කළහැක. මෙ මගින් බෝග අස්වනු සාපේක්ෂව ඉතා කෙටි කාලයකදී ඉහළ නැගෙනු ඇත. නිෂ්පාදන පිරිවැය පහත වැටීමක්ද මින් බලාපොරොත්තු විය හැකි අතර නිපයෙන කෘෂි නිමැවුම් වෙළඳපොලට එන ඉඩකඩ පුළුල්වී පාරිභෝගික පහසුවද සැලසෙනු ඇත.

මෙවැනි ගම්මාන පිහිටුවීමෙන් හා නිෂ්පාදන ඉහළ නැංවීමේදී තවත් කරුණු කිහිපයක් ගැනද සැලකිලිමත්විය යුතුය. ගොවීන්ගේ නිෂ්පාදන ප්‍රාදේශීයව ගබඩා කිරීමේ පහසුකම්-සකස් කිරීමේ හා පාරිභෝගිකයාට අලෙවි කිරීමේ පහසුකම්ද සැලසිය යුතුය. ඒ අතරම ගොවීන් කෙරෙහි පවතින සැලකිල්ල සහ ගෞරවය අප විසින් නොමදව ලබාදීම ඉතා වැදගත්ය. කුමන සම්පත් හෝ පහසුකම් ලබාදුන්නත් සමාජමය ගෞරවය ගොවීන්ගේ අභිමානයට හේතුවන පරිදි වෙනස් විය යුතුය. එසේ වුවොත් පමණක් තමන්ද සමාජ ව්‍යුහයේ වැදගත් තැනක් උසුලන බව තේරුම් ගැනීමෙන් ඔවුන් නිෂ්පාදන කාර්යාවලියේ වැදගත් නියමුවන් බවට පත්වනු ඇත.